**නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව**

## ප්‍රසම්පාදන අංකය S/635/24



DRAFT

## දියත උයන පරිශ්‍රයේ වෙළඳ කුටි 12 ක් කුලියට දීම සඳහා ලංසු කැඳවීම

**<u>ලංසු කැඳවීම අවසන් කිරීම</u>**

**දිනය : 2025.01.16**

**වේලාව : ප.ව. 01.30**

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම්)
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය
දුරකථන : 011-2866832


# මාර්ග සිතියම සහ ස්ථාන සිතියම

## ස්ථානය - දියත උයන




රූප සටහන 01




රූප සටහන 02

**<u>අත්‍යාවශ්‍යම ලිපිගොනු පරීක්ෂාව</u>**

- 09 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර අත්සන් කරන ලද මිල ගණන් දැක්වීමේ වගුව (ප්‍රමාණ බිල්පත්‍රය)
- 3.3 වගන්තියට අනුව ලංසු ඇපකරයෙහි මුල් පිටපත
- මල් පැළ විකිණීම සඳහා ඉල්ලුම් කරන්නේ නම්,
    a. පැළ තවානක් පවත්වාගෙන යන බවට ග්‍රාම නිළධාරී විසින් ලබා දෙනු ලබන සහතිකය
    b. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බීජ හසුරුවීම සඳහා ලබා දෙනු ලබන සහතිකය හෝ එම සහතිකය දැනට නොපවතින්නේ නම්, ලංසු කැඳවීම අවසන් කරන දින සිට මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කරන බවට ලංසුකරු විසින් අත්සන් කරන ලද ලිපියක්
- අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්
- ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ එම සහතිකය දැනට නොපවතින්නේ නම්, ලංසු කැඳවීම අවසන් කරන දින සිට මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කරන බවට ලංසුකරු විසින් අත්සන් කරන ලද ලිපියක්

## 1.0 <u>හැඳින්වීම</u>

සභාපති, ප්‍රසම්පාදන කමිටුව ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව (මින් පසුව "සංස්ථාව" ලෙස හඳුන්වනු ලැබේ) විසින් දියත උයන පිහිටි වෙළඳ කුටි 12 ක් (රූප සටහන 2 හි දක්වා ඇති 01, 52, 53, 81, 126, 128, 129, 132, 133, 135, 137, 138 යන වෙළඳ කුටි) සතිපතා කුලී පදනම මත වසර 01 ක් සඳහා ගිවිසුමක් යටතේ පවත්වාගෙන යාමට පහත 2.2 හි සඳහන් ව්‍යාපාර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ලංසු කැඳවනු ලබයි.

## 2.0 <u>ලංසුකරුවන් සඳහා උපදෙස්</u>



2.1 ජාතික තරඟකාරී ලංසු ක්‍රමය (NCB) හරහා ලංසු පත්‍රිකා ඉදිරිපත් කරනු ලැබේ.

2.2 ලංසුකරුවන්ට පහත සඳහන් යෝජනා 01 හෝ 02 යටතේ ලංසු ඉදිරිපත් කළ හැක.

යෝජනාව 01 - <u>සඳුදා සිට ඉරිදා දක්වා සිදුකරන ව්‍යාපාර</u>

- සඳුදා සිට බ්‍රහස්පතින්දා - ආහාරපාන හා මල් පැළ විකිණීමේ ව්‍යාපාර **<u>හැර</u>** අනෙකුත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර
- සිකුරාදා සිට ඉරිදා - ආහාරපාන **<u>හැර</u> මල් පැළ විකිණීමද ඇතුලත්ව** අනෙකුත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර. කෙසේවෙතත් මල් පැළ විකිණීම සඳහා ප්‍රමුඛත්වය හිමිවේ.

READ ONLY

යෝජනාව 02 - <u>සිකුරාදා සිට ඉරිදා දක්වා සිදුකරන ව්‍යාපාර</u>

- ආහාරපාන **<u>හැර</u> මල් පැළ විකිණීමද ඇතුළත්ව** අනෙකුත් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර. කෙසේවෙතත්, මල් පැළ විකිණීම සඳහා ප්‍රමුඛත්වය හිමිවේ.

ලංසුකරුවන්ට ඉහත එක් යෝජනාවකට පමණක් ලංසු ඉදිරිපත් කිරීමට හැක.

2.3 ලංසු පත්‍රිකාව නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සැපයුම්) වෙතින් 2024.12.18 සිට 2025.01.15 දින දක්වා (වැඩකරන දින වලදී) පෙ.ව. 09.00 සිට ප.ව. 03.00 දක්වා ආපසු නොගෙවන **රු.2,500/-** ගෙවා මිලදී ගත හැක.

2.4 වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා

සැලසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශය
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ,
රාජගිරිය
දුරකථන :- 011-2871167, 011-2861170, 071-3665151, 071-0387168

2.5 මිල ගණන් ඉදිරිපත් කිරීමට නියමිත කාල සීමාවට ප්‍රථම ඕනෑම අවස්ථාවක ලිඛිතව හෝ ෆැක්ස් මාර්ගයෙන් අතිරේක ලේඛනයක් නිකුත් කිරීම මගින් ලංසු පත්‍රිකාව සංශෝධනය කිරීමට සංස්ථාවට හැකියාව පවතී.

2.6 සෑම ලංසුකරුවෙකුටම වෙළඳ කුටි 12 සඳහාම ලංසු ඉදිරිපත් කළ හැක. එනමුත් එක් ලංසුකරුවකුට එක් වෙළඳ කුටියක් සඳහා ඉදිරිපත් කළ හැක්කේ එක් ලංසුවක් පමණි. එසේ එක් ලංසුකරුවකු එක් වෙළඳ කුටියකට ලංසු කිහිපයක් ඉදිරිපත් කළහොත් එම කුටිය අදාල ලංසුකරුගේ සියළු ලංසු ප්‍රතික්ෂේප වේ.

එක් ලංසුකරුවකු වෙළඳ කුටි දෙකක් හෝ වැඩි ගණනක් සඳහා ලංසු ඉදිරිපත් කරන්නේ නම්, එක් එක් වෙළඳ කුටිය සඳහා වෙන වෙනම ලංසු පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය.

එලෙස වෙළඳ කුටි (දෙකක් හෝ වැඩි ගණනක් සඳහා) ලංසු ඉදිරිපත් කිරීමේදී, එක් ලංසුකරුවෙකුට වෙළඳ කුටි එකක් පමණක් ලබා ගැනීමේ හැකියාව ඇති අතර, කුමන වෙළඳ කුටිය එම ලංසුකරුට ලබා දෙනවාද යන්න තීරණය සංස්ථාව සතු වන අතර එම තේරීම සංස්ථාවට උපරිම ආර්ථික ප්‍රතිලාභය ලැබෙන පරිදි සිදු කරනු ලැබේ.

2.7 සෑම ලංසුකරුවෙක්ම තම ලංසුව ඉදිරිපත් කිරීමට ප්‍රථම අදාල වෙළඳ කුටිය පිහිටා ඇති ස්ථානය සහ ඒ අවට පරීක්ෂා කිරීම කළ යුතු අතර එසේ පරීක්ෂා කිරීම සඳහා අදාල ස්ථානයට පැමිණීමේ පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතුවේ.

2.8 සෑම ලංසුකරුවෙක්ම තම ලංසුව පිළියෙල කිරීම සඳහා දරණ පිරිවැය තමන් විසින්ම දැරිය යුතු අතර සංස්ථාව එවැනි කිසිදු ආකාරයේ පිරිවැයක් දැරීමට යටත් නොවන අතර, ලංසුකරු දරණ පිරිවැය නැවත ගෙවීමක්ද සිදු නොකරයි.

## 3.0 <u>ලංසු පත්‍රිකා පිළියෙල කිරීම</u>

3.1 ලංසුවකරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ටෙන්ඩර් පත්‍රිකාවේ සඳහන් කරුණු සිංහල භාෂාවෙන් සම්පූර්ණ කල යුතුය.

3.2 ලංසුව ඉදිරිපත් කිරීම සඳහා පහත ලිපි ලේඛන සම්පූර්ණ කළ යුතුය.

I. 09 පිටුවෙහි සඳහන් නිවැරදිව සම්පූර්ණ කර අත්සන් කරන ලද මිල ගණන් දැක්වීමේ වගුව (ප්‍රමාණ බිල්පත්‍රය)

READ ONLY

II. 3.5 වගන්තියට අනුව ලංසු ඇපකරයෙහි මුල් පිටපත

III. මල් පැළ විකිණීම සඳහා ඉල්ලුම් කරන්නේ නම්,

a. පැළ තවානක් පවත්වාගෙන යන බවට ග්‍රාම නිළධාරී විසින් ලබා දෙනු ලබන සහතිකය
b. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බීජ හසුරුවීම සඳහා ලබා දෙනු ලබන සහතිකය හෝ එම සහතිකය දැනට නොපවතින්නේ නම්, ලංසු කැඳවීම අවසන් කරන දින සිට මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කරන බවට ලංසුකරු විසින් අත්සන් කරන ලද ලිපියක්

IV. අයිතිකරුගේ/අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම්පතෙහි පිටපතක්

V. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ එම සහතිකය දැනට නොපවතින්නේ නම්, ලංසු කැඳවීම අවසන් කරන දින සිට මාස 03 ක් ඇතුළත ඉදිරිපත් කරන බවට ලංසුකරු විසින් අත්සන් කරන ලද ලිපියක්

සටහන - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බීජ හසුරුවීම සඳහා ලබා දෙනු ලබන සහතිකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් දැනට ලංසුකරුට නොමැති නම්, එම ලංසුකරු මාස 03 ක් ඇතුළත එම සහතිකය ඉදිරිපත් කරන බවට ලිපියක් ලංසුකරුගේ අත්සනින් ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ලංසුකරුගේ ලංසුව ප්‍රතික්ෂේප වනු ඇත.

READ ONLY

3.2 <u>ලංසුවෙහි වලංගුභාවය</u>

ලංසුකරු විසින් ඉදිරිපත් කරන ලංසු 2025.03.06 දින දක්වා වලංගු විය යුතු විශේෂ අවස්ථාවකදී මුල් ලංසුවේ වලංගු කාල සීමාව දීර්ඝ කිරීමට සංස්ථාවට හැකිය.

3.3 <u>ලංසු ඇපකරය</u>

ලංසුකරුවන් විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමත වාණිජ බැංකුවකින් ලබාගත් රු.15,000/- ක ලංසු ඇපකරයක් ලංසු පත්‍රිකාව සමග ලබාදිය යුතු අතර, ලංසු ඇපකරය 2025.04.03 දක්වා වලංගු විය යුතුය. (ආදර්ශ ආකෘතිය ඇමුණුම 01 හි දක්වා ඇත).

ලංසුකරු විසින් මුදලින් ඇපකර ඉදිරිපත් කරන්නේ නම් (චෙක්පත් සහ වෙනත් ආකාරයක ගෙවීම් ක්‍රම හැර) සංස්ථාවෙහි ගිණුම් අංශය වෙත ගෙවීම් සිදුකර ලබාගත් <u>ලදුපතෙහි මුල් පිටපත, ඉදිරිපත් කරන ලංසු පත්‍රිකාව සමඟ ඇමිණිය යුතුය.</u>

3.4 ලංසුකරුවකුගේ හෝ ඔවුන්ගේ එක් නියෝජිතයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන පෙර ලංසු රැස්වීම 2025.01.09 දින පෙ.ව.10.00 ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවෙහි සැළසුම් හා ව්‍යාපාර සංවර්ධන අංශයේදී පැවැත්වේ. එහිදී ලංසුකරුට/ලංසුකරුවන්ට යම් ගැටළුවක් වේ නම් එම ගැටළුව රැස්වීම පැවැත්වීමට නියමිත දිනට පෙර ලිඛිතව හෝ විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කළ යුතුය.

3.5 තෝරාගත් ලංසුකරුවන්ට ඉහත 2.2 හි සඳහන් ව්‍යාපාර පමණක් කිරීමට අවසර ලබාදෙනු ඇති අතර, එසේ ඇතිවන ඕනෑම ගැටළුවකදී/මත ගැටුමකදී සංස්ථාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

3.6 <u>අවම ගාස්තුව</u>

ලංසුකරුවන් ඉදිරිපත් කළ යුතු අවම ලංසු මුදල (වැට් බදු රහිතව) පහත පරිදි වේ.

- යෝජනාව 01 සඳුදා සිට ඉරිදා දක්වා පවත්වන ව්‍යාපාර - එක් සතියක් සඳහා රු.10,238.00
- යෝජනාව 02 සිකුරාදා සිට ඉරිදා දක්වා පවත්වන ව්‍යාපාර - එක් සතියක් සඳහා රු.6,000.00

ලංසුකරුගේ පිටු අංක 09 හි ඇති මිල ගණන් දැක්වීමේ ලේඛනයේ ලංසු මිල සඳහන් කරන අගය (ප්‍රමාණ බිල්පත්‍රයේ A1 යන අගය) අවම ලංසුවට වඩා අඩුවෙන් ඇති අවස්ථාවක, ලංසුව <u>ප්‍රතික්ෂේප වනු ඇත.</u>

3.7 **ආපසු ගෙවනු ලබන තැන්පතුව**

තෝරාගත් ලංසුකරු විසින් වෙළඳාම් කටයුතු සිදු කිරීමට පෙර රු.25,000/- ක ආපසු ගෙවන තැන්පතු මුදලක් ව්‍යාපාර ප්‍රදාන ලිපියේ සඳහන් දින සිට දින හතක් ඇතුළත සංස්ථාවට තැබිය යුතුය.

**4.0 ලංසු ඉදිරිපත් කිරීම**

4.1 ලංසුකරුවන් තම ලංසුව මුද්‍රා තබන ලද ලියුම් කවරයක් තුල ඉදිරිපත් කල යුතුය.

4.2 ලංසු ඇපකරය මුදලින් ගෙවීම සිදුකරයි නම් එම රිසිට්පත හෝ බැංකු ඇපකරය ලංසු පත්‍රය සමඟ අමුණා තිබිය යුතුය.

4.3 ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරෙහි "**ප්‍රසම්පාදන අංක S/635/24**" සහ "**දියත උයන පරිශ්‍රයේ වෙළඳ කුටි 12 ක් කුලියට දීම සඳහා ලංසු කැඳවීම** යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය.

4.4 ලංසුව බහා ඇති ලියුම් කවරයේ පහත ලිපිනය සඳහන් කළ යුතුය.

**සභාපති - ප්‍රසම්පාදන කමිටුව,**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය**

සියළුම ලංසු ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් එවීම <u>හෝ</u> පහත ලිපිනයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතුය.

**සැපයුම් අංශය,**
**ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව,**
**නො 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,**
**වැලිකඩ, රාජගිරිය**

4.5 ලංසු පත්‍රිකා භාරගැනීම 2025.01.16 දින ප.ව.01.30 ට අවසන් වීමට නියමිත වන අතර එම වේලාව ඉක්මවූ වහාම සියළුම ලංසු විවෘත කරනු ලැබේ. සංස්ථාවේ අභිමතය පරිදි අවශ්‍ය නම් අදාල දිනය දීර්ඝ කළ හැක.

4.6 ලංසු ඉදිරිපත් කිරීම සඳහා සපයා ඇති අවසන් දිනට සහ වේලාවට ඉදිරිපත් නොවන සියළුම ලංසු ප්‍රතික්ෂේප වන අතර, එම ලංසු ලංසුකරු වෙත ආපසු යවනු ලැබේ.

4.7 ලංසුවක් ඉදිරිපත් කිරීමෙන් පසුව එම ලංසුව වෙනස් කිරීමට හෝ ඉවත් කිරීමට කිසිදු ලංසු කරුවෙකුට අවසර හිමි නොවනු ඇත. ලංසුව භාරදීමෙන් අනතුරුව ලංසුවල වලංගු කාල සීමාව තුල කිසියම් ලංසුකරුවෙකු විසින් තම ලංසුව ඉවත් කර ගනනේ නම්, 3.3 හි සඳහන් අදාල ලංසු ඇපකරය සංස්ථා සන්තක වේ.

READ ONLY

5.0 **ලංසු විවෘත කිරීම සහ ඇගයීම**

5.1 ලංසු ඉදිරිපත් කිරීම සඳහා ලබාදී තිබූ අවසන් දින එම වේලාව ඉක්මවූ වහාම සියළුම ලංසු විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට අදාළ ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයින් එක් අයෙකුට පමණක් සහභාගි විය හැකි අතර පැමිණීමේ ලේඛණය අත්සන් කිරීම මගින් ඔවුන්ගේ පැමිණීම තහවුරු කළ යුතුය.

5.2 ලංසුකරුගේ නම, ඉදිරිපත් කර ඇති සතියක කුලී අගය, ලංසු ඇපකරය සහ අවශ්‍ය (ඉදිරිපත් කිරීමට බැඳී සිටින) අනෙකුත් තොරතුරු එම අවස්ථාවේදී ප්‍රකාශ කරනු ඇත.

5.3 ලංසුකරුවන් විසින් ඉදිරිපත් කර ඇති මිල ගණන් පරීක්ෂා කිරීම ලංසු සැසඳීම හා ඇගයීම සම්බන්ධ තොරතුරු පැහැදිලි කිරීම, කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා ඉදිරිපත් කර ඇති නිර්දේශ යනාදිය ලංසුකරු වෙත අනාවරණය නොකරනු ඇත. ලංසු කැඳවීම හා ඒ සම්බන්ධ තීරණ

ගැනීමේ සංස්ථාවේ ක්‍රියාවලියට බලපෑම් කිරීම සඳහා ලංසුකරු විසින් දරණ ඕනෑම ප්‍රයත්නයක්, එම ලංසුකරු විසින් ලබාදී ඇති ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතු වේ.

5.4 මෙම සංස්ථාව විසින් සංස්ථාවට උපරිම ආර්ථික ප්‍රතිලාභය ලැබෙන අයුරින් වෙළඳ කුටි සඳහා ලංසුකරුවන් තෝරාගනු ලැබේ.

## 6.0 <u>කොන්ත්‍රාත්තුව පිරිනැමීම හා ව්‍යාපාර කටයුතු ආරම්භය</u>

6.1 ඉදිරිපත් කර ඇති ලංසු වල වලංගු භාවය ඉකුත් වීමට ප්‍රථම සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරු වෙත ඔහුගේ ලංසුව පිළිගත් බව සඳහන් කරමින් "ව්‍යාපාරය ප්‍රදානය කිරීමේ ලිපිය" ලියාපදිංචි තැපැල් මගින් යොමු කරනු ඇත. සංස්ථාව සහ අදාල තෝරාගත් ලංසුකරු අතර විධිමත් ගිවිසුමක් අත්සන් කරන තුරු මෙම "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" හා ප්‍රසම්පාදන ලියවිල්ලේ සඳහන් කරුණු නිත්‍යානුකූල ලේඛනය හෙවත් ගිවිසුම ලෙස පිළිගනු ලබන්නේ ය.

6.2 "ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපිය" ලැබීමෙන් දින 07 ක් ඇතුලත තෝරාගත් ලංසුකරු විසින් තම ව්‍යාපාර කටයුතු ආරම්භ කළ යුතු අතර, <u>ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපියේ සඳහන් දින සිට සතිපතා කුලිය ගණනය කිරීම ආරම්භ වනු ඇත.</u>

6.3 ව්‍යාපාරය ප්‍රදානය කිරීමට ප්‍රථම ඕනෑම අවස්ථාවකදී ඕනෑම ලංසුවක් හෝ සියළුම ලංසු ප්‍රතික්ෂේප කිරීමට හෝ අදාල ලංසු ක්‍රියාවලිය අවලංගු කිරීමට සංස්ථාව සතුව බලය ඇත.

6.4 තෝරාගත් ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමෙන් පසුව හෝ ලංසුවල වලංගු කාලය ඉකුත් වීමෙන් පසුව සියළු ලංසුකරුවන්ගේ ලංසු ඇපකර නිදහස් කරනු ලැබේ.

## 7.0 <u>නියමයන් සහ කොන්දේසි</u>

7.1 අදාල තෝරාගත් ලංසුකරුගේ කාර්ය සාධනය පදනම් කරගනිමින් උපරිම අවුරුදු එකකට (01) යටත්ව ගිවිසුමක් මගින් අදාල වෙළඳ කුටිය කුලී පදනම මත තෝරාගත් ලංසුකරුට ලබාදෙනු ඇත. මීට අමතරව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බීජ හසුරුවීම සඳහා ලබා දෙනු ලබන සහතිකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් දැනට ලංසුකරු සතුව නොමැති නම්, එම ලංසුකරු මාස 03 ක් ඇතුළත එම සහතිකය ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් ලංසුකරුගේ ලංසුව ප්‍රතික්ෂේප වනු ඇත.

7.2 සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරුගේ ගිවිසුම් කාලය දීර්ඝ කිරීමට තීරණය කරන අවස්ථාවකදී ඉදිරි වර්ෂය සඳහා වන සතිපතා කුලිය ගණනයේදී, වර්තමාන වර්ෂය සඳහා ගෙවන සතිපතා කුලී වටිනාකමට 10% එකතු කරනු ලැබේ.

7.3 සතිපතා ගෙවීමට හැකි කුලී මුදල මිල ගණන් දැක්වීමේ ලේඛනයේ අකුරෙන් සහ ඉලක්කමෙන් ලිවීම අනිවාර්ය වන අතර, ඕනෑම ගැටළු සහගත තත්ත්වයකදී අකුරින් සඳහන් අගය බලපවත්වන්නේ ය.

### 7.4 <u>ආරක්ෂිත තැන්පතු</u>

තෝරාගත් ලංසුකරු විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙර, ව්‍යාපාර ප්‍රදානය කිරීමේ ලිපියේ දින සිට දින 07 ක් ඇතුළත දෛනික කුලී වාරිකය සමග **රු.25,000/-** ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් ලෙස (Refundable Depost) රු.25,000/- ක මුදලක් සංස්ථාවේ තැන්පත් කළ යුතුය.

එම තැන්පත් මුදල නිදහස් කිරීම පහත සඳහන් කොන්දේසි වලට යටත්ව සිදුවේ.

I. තෝරාගත් ලංසුකරු තම ව්‍යාපාරය අඛණ්ඩව වසරක් පුරා පවත්වාගෙන යා යුතුය. එම වසර අවසානයේදී ව්‍යාපාරයෙන් ඉවත්ව යාමට අදහස් කරයි නම්, අදාල වසර අවසානයේදී ව්‍යාපාරයෙන් ඉවත්ව යා හැකිය. එහිදී ව්‍යාපාරය පවත්වාගෙන යෑමේදී සංස්ථාවට අයවිය යුතු සතිපතා බදු මුදල් සහ වෙළඳ කුටියට අලාභයක් වී තිබේනම් එය

READ ONLY

සංස්ථාව විසින් තක්සේරු කර එම හානි මුදල, තැන්පත් මුදල වන රු.25,000/- න් අඩුකර ඉතිරි මුදල නිදහස් කරනු ඇත.

II. තෝරාගත් ලංසුකරු තම ව්‍යාපාරය පූර්ව ලෙස දැනුම් දී හෝ දැනුම් දීමක් සිදු නොකර කුමන හෝ හේතුවක් මත වසරකට වඩා අඩු කාලයකදී නවතා දමන අවස්ථාවකදී, තැන්පත් මුදල වන රු.25,000/- සංස්ථාව සන්තක වේ.

III. 7.5, සහ 7.6 උප ඡේදයන්හි දක්වා ඇති පරිදි සංස්ථාවට අයවිය යුතු මුදල් නොගෙවන තත්ත්වයකදී සංස්ථාව විසින් ගිවිසුම අවලංගු කරන අවස්ථාවේදී ඉහත (ii) හි සඳහන් පරිදි ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සන්තක කරගනු ඇත.

IV. ඉහත (i), (ii), (iii) යන ඕනෑම අවස්ථාවකදී, සඳහන් කර ඇති පරිදි සංස්ථාවට අයවිය යුතු හිඟ මුදලේ ප්‍රමාණය රු.25,000/- ඉක්මවන අවස්ථාවකදී, එම ඉක්මවන මුදල, තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාවට ගෙවිය යුතුය.

V. 7.17 හි සඳහන් පරිදි ව්‍යාපාර කටයුතු සිදු නොකිරීම නිසා ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සන්තක කරගනු ඇත.

VI. 7.19 හි සඳහන් පරිදි අදාල සහතික ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අවස්ථාවකදී ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සන්තක කරගනු ඇත.

7.5 තෝරාගත් ලංසුකරුවන් සෑම සතියකම ආරම්භක දින 02 තුළ එම සතියට අදාළ සියළුම ගෙවීම් සිදු කළ යුතුය. එලෙස ගෙවීම් නොකරන අවස්ථාවකදි ඊළඟ සතියේ ව්‍යාපාර කටයුතු කිරීම සඳහා සුදුසු පුද්ගලයෙකු/ව්‍යාපාරයකට ලබා දීමට සංස්ථාවට පූර්ණ බලය සතුය.

7.6 එම කුලී හා ගාස්තු ඉහත 7.5 හි සඳහන් ආකාරයට ගෙවීමට අපොහොසත් වන්නේ නම්, සංස්ථාව සහ ලංසුකරු අතර ඇති ගිවිසුම අවලංගු කිරීමට හා මෙම ලංසු පත්‍රිකාවෙහි 7.4 හි සඳහන් ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සන්තක කිරීමට සංස්ථාවට පූර්ණ බලය පවතින්නේ ය. අනතුරුව වහාම ව්‍යාපාරික ස්ථානය නිසි පරිදි නැවත සංස්ථාවට භාරදීමට කටයුතු කළ යුතුය.

7.7 ගිවිසුම අවලංගු වීමෙන් අනතුරුව, සියළුම ආකාර හිඟ මුදල් සංස්ථාව වෙත ගෙවීමට කටයුතු කළ යුතුය.

7.8 අදාල වෙළඳ කුටිය දිනපතා පෙ.ව.09.00 සිට ප.ව.11.00 දක්වා විවෘතව තැබිය යුතුය.

7.9 අදාල වෙළඳ කුටිය හෝ කොටසක් වෙනත් පාර්ශවයන් වෙත ව්‍යාපාර කටයුතු හෝ වෙනත් කටයුත්තකට ලබාදීමට තෝරාගත් ලංසුකරුට කිසිදු අයිතියක් නොමැත. එවැනි අවස්ථාවක් පිළිබඳ අනාවරණය වුවහොත් ගිවිසුම් අවලංගු කිරීමට සංස්ථාවට පූර්ණ බලය පවතී.

7.10 අදාල වෙළඳ කුටිය, අවට පරිසරයට හා ස්ථානයට ගැලපෙන අයුරින් සංවර්ධනය කර ඇති බැවින්, කිසිදු වෙනසක් හෝ අලංකරණ කටයුත්තක් සිදුකිරීමට තෝරාගත් ලංසුකරුට අවසරයක් නොමැත. ශබ්ද විකාශ යන්ත්‍ර මගින් ප්‍රවර්ධන කටයුතු සිදු කිරීමට ඉඩදෙනු නොලැබේ.

7.11 අවට පරිසරය හා වෙළඳපොල සෑම විටම ඉතා පිරිසිදුව හා ආකර්ෂණීයව පවත්වාගෙන යා යුතුය.

7.12 වෙළඳ කුටිය තුල හෝ ඒ අවට දුම්වැටි මත්පැන් හෝ වෙනත් මත්ද්‍රව්‍යය විකිණීම හෝ භාවිතය සපුරා තහනම් වන අතර හා වෙනත් නිතී විරෝධී ව්‍යාපාර කිසිවක් සිදු කිරීමද සපුරා තහනම් වේ.

7.13 තෝරාගත් ලංසුකරු විසින් ප්‍රචාරණය උදෙසා නාම පුවරු බැනර් යනාදිය වෙළඳ කුටිය තුල ප්‍රදර්ශනය කිරීමට අපේක්ෂා කරන්නේ නම් ඊට ප්‍රථම එකී සියළු ප්‍රචාරණ ක්‍රම සවිස්තරව සංස්ථාව වෙත ඉදිරිපත් කොට නිසි අවසර ලබාගත යුතුය. තවද එකී සියළු ප්‍රචාරණ කටයුතු සඳහා පිරිවැය ලංසුකරු විසින් දැරිය යුතුය.

7.14 වෙළඳ කුටියේ සේවයට යොදා ගන්නා සේවකයින් ගණන, ඔවුන්ගේ නම්, ජාතික හැඳුනුම්පත් අංක සහ අනෙකුත් විස්තර තෝරාගත් ලංසුකරු විසින් සංස්ථාව වෙත ඉදිරිපත් කළ යුතුය.

7.15 සංස්ථාව විසින් තෝරාගත් ලංසුකරුගේ ව්‍යාපාර කටයුතු හා කාර්යසාධනය අඛණ්ඩව ඇගයීමකට ලක් කරනු ලැබේ. වසරකට පසුව ගිවිසුම අලුත් කිරීම හෝ අවලංගු කිරීමේ පූර්ණ බලය සංස්ථාව සතු වේ.

READ ONLY

7.16 නියමයන් සහ කොන්දේසි උල්ලංඝනය කිරීම හෝ නීති විරෝධී කටයුතු සිදුකිරීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීමට අවශ්‍ය යැයි සංස්ථාවට හැඟුනහොත් පරීක්ෂණයක් සිදු කර එයින් කොන්දේසි උල්ලංඝනය කළ බව සනාථ වුවහොත් ඕනෑම තෝරාගත් ලංසුකරුවෙකු සමග ඇති ගිවිසුම අවලංගු කිරීමට අවශ්‍ය පූර්ණ බලය සංස්ථාව සතුවන අතර, එවැනි අවස්ථාවකදී ලංසුකරුගේ ආරක්ෂක තැන්පතු සංස්ථාව සන්තක වන්නේ ය.

7.17 තෝරාගත් ලංසුකරු/වන් මසකට අනිවාර්යයෙන් සති හතරක කාලයක් ව්‍යාපාර කටයුතු සිදු කළ යුතුය. යම් හෙයකින් තෝරාගත් ලංසුකරු/වන් එලෙස කටයුතු කිරීමට අපොහොසත්වන අවස්ථාවකදී ගිවිසුම අවලංගු කිරීමටත් තබා ඇති ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සන්තක කිරීමටත් සංස්ථාවට බලය ඇත. සතිපතා ගෙවීම් පැහැර හරින අවස්ථාවකදී 7.5 වගන්තිය යටතේ එම ගෙවීම් නොකළ සතිවල ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා සුදුසු පුද්ගලයෙකු/ව්‍යාපාරයකට ලබා දීමට සංස්ථාවට පූර්ණ බලය සතුය.

7.18 තෝරාගත් ලංසුකරුගේ ව්‍යාපාර භාණ්ඩ වල ආරක්ෂාව සඳහා ලංසුකරු විසින්ම දැරිය යුතු අතර, සංස්ථාව කිසිදු වගකීමට නොබැඳේ.

7. 19 කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් බීජ හසුරුවීම සඳහා ලබා දෙනු ලබන සහතිකය හෝ ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකයක් ලංසුව ඉදිරිපත් කරන අවසන් දින වන විට තෝරාගත් ලංසුකරු සතුව නොමැති නම්, එම තෝරාගත් ලංසුකරු මාස 03 ක් ඇතුළත එම සහතිකය ඉදිරිපත් කළ යුතුය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් තෝරාගත් ලංසුකරුගේ ගිවිසුම අහෝසි වන අතර, ආරක්ෂිත තැන්පතුව සංස්ථාව සන්තක වේ.

READ ONLY

## ප්‍රමාණ බිල්පත
## දියත උයන පරිශ්‍රයේ වෙළඳ කුටි 12 ක් කුලියට ලබාදීම සඳහා ලංසු කැඳවීම

ලංසු ඉදිරිපත් කරන වෙළඳ කුටි අංකය :- ......................
(රූප සටහන 2 හි සඳහන් 01,52, 53, 81, 126, 128, 129, 132, 133, 135, 137 සහ 138 වෙළඳ කුටි අතරතුරින්)

| අයිතම අංකය | විස්තරය | සතිපතා කුලිය (බදු රහිත) (රු) A1 |
|---|---|---|
| 01 | <u>යෝජනාව 01</u><br>- සඳුදා සිට බ්‍රහස්පතින්දා දක්වා සිදු කිරීමට නියමිත ව්‍යාපාරය .............. (ලංසුවේ 2.2 ට යටත්ව)<br>- සිකුරාදා සිට ඉරිදා දක්වා සිදු කිරීමට නියමිත ව්‍යාපාරය .............. (ලංසුවේ 2.2 ට යටත්ව) | .............. (සඳහන් කළ හැකි **<u>අවම</u>** මිල රු.10,238/-කි) |
| | **<u>එකතු</u>** VAT 18% | |
| | **මුළු එකතුව** | |

| අයිතම අංකය | විස්තරය | සතිපතා කුලිය (බදු රහිත) (රු) A1 |
|---|---|---|
| 01 | <u>යෝජනාව 02</u><br>- සිකුරාදා සිට ඉරිදා දක්වා සිදු කිරීමට නියමිත ව්‍යාපාරය .............. (ලංසුවේ 2.2 ට යටත්ව) | .............. (සඳහන් කළ හැකි **<u>අවම</u>** මිල රු.6,000/- කි) |
| | **<u>එකතු</u>** VAT 18% | |
| | **මුළු එකතුව** | |

සතිපතා කුලිය සඳහා (A1 හි සඳහන් අගය) අකුරින්

.................................................................................................................. + VAT

වාර්ෂික අගය අකුරින්

.................................................................................................................... + VAT

---

**<u>සටහන්</u>**

- ලංසුකරුවන්ට ඉහත **<u>එක් යෝජනාවකට පමණක්</u>** ලංසු ඉදිරිපත් කළ හැක.
- යෝජනාව 01 හා යෝජනාව 02 හි **<u>A1</u>** තීරුව තුළ සඳහන් කළ හැකි **<u>අවම මිල</u>** අගය පිළිවෙලින් රු.10,238/- හා රු.6,000/- වන අතර ඊට අඩුවෙන් තබන ලංසු ප්‍රතික්ෂේප වේ.

ලංසුකරුගේ අත්සන :- ..................................................
නම :- ..................................................
ජා. හැ. අංකය :- ..................................................
ලිපිනය :- ..................................................
දුරකථන අංකය :- ..................................................

සාක්ෂි 01 අත්සන :- ........................................
නම :- ........................................
ජා. හැ. අංකය :- ........................................
ලිපිනය :- ........................................

සාක්ෂි 02 අත්සන :- ........................................
නම :- ........................................
ජා. හැ. අංකය :- ........................................
ලිපිනය :- ........................................

READ ONLY

**Annexure 1**

# SPECIMEN FORM OF TENDER SECURITY

…………………………………..
…………………………………..
…………………………………..
(Name & Address of Guarantor)

**Beneficiary;**
General Manager,
Sri Lanka Land Development Corporation,
No 03,
Sri Jayawardenapura Mawatha,
Rajagiriya.

Whereas,............................................................... (Name of Tenderer) (hereinafter called and referred to as "the Tenderer"), has submitted its Tender dated..................... (Date) for the "Renting of the 12 Nos. of Stalls (Stage I and Stage II) at Diyatha Uyana" (hereinafter called and referred to as "the Tender"). KNOW ALL PEOPLE by these presents that WE................................................... (Name of organization) having our registered office at.......................................... (hereinafter called and referred to as "the Guarantor"), are bound unto "General Manager, Sri Lanka Land Development Corporation, No. 03, Sri Jayawardenapura Mawatha, Rajagiriya" (hereinafter called and referred to "the Employer") in the sum of Sri Lanka Rupees 15,000.00 for which payment well and truly to be made to the said Employer. The Guarantor binds itself, its successors, and assignees by these presents.
SEALED with the Common Seal of the said Guarantor this .......................... day of...........................
We undertake to pay the Employer unconditionally up to the above amount upon receipt of its first written demand, without the Employer having to substantiate its demand provided that in its demand the Employer will note that the amount claimed by it is due to it, specifying the occurred condition or conditions.

This Guarantee will remain in force up to …………………. and any demand in respect thereof shall be received by us no later than the above date.

DATE ................................
SIGNATURE OF THE GUARANTOR..........................................

WITNESS............................ SEAL
................................................
(Signature, Name and Address)

READ ONLY